# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 896/2 - 1995 නොවැම්බර් 07 වැනි අඟහරුවාදා - 1995.11.07

896/2 ஆம் இலக்கம் — 1995 ஆம் ஆண்டு நவெம்பர் மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை

**No. 896/2 - TUESDAY, NOVEMBER 07, 1995**


රල් වි - ති 21/78 IV.

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

## 21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන්–

(i) සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යය, කෘෂිකර්මය හා විද්‍යාව යන ඉගෙනුම් අංශයන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ විශ්වවිද්‍යාලයක් 1995 නොවැම්බර් මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවමි.

(ii) ඒ විශ්ව විද්‍යාලයට "ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය" යන නාමය හා අභිධානය දෙමි ;

(iii) ඒ විශ්වවිද්‍යාලය පිහිටිය යුතු ස්ථානය, අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ විය යුතු බවට නියම කරමි ;

(iv) ඒ විශ්වවිද්‍යාලයට සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර, කළමනාකරණ අධ්‍යයන, කෘෂිකාර්මික විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා සඳහා වූ පීඨ පවරා දෙමි ; සහ

(v) මෙහි උපලේඛනයේ 1 වන තීරයෙහි දක්වා ඇති, ඒ විශ්වවිද්‍යාලයෙහි එක් එක් පීඨය ඒ උපලේඛනයේ 2 වන තීරයෙහි අනුරූප සටහනේ දක්වා ඇති අධ්‍යයන අංශයන්ගෙන් සමන්විත විය යුතු යැයි නියම කරමි.

රිචඩ් පතිරණ
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය

1995 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය<br>ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයන අංශය |
| කෘෂිකාර්මික විද්‍යා පීඨය | වැවිලි කළමනාකරණ අධ්‍යයන අංශය<br>උද්භිද විද්‍යා අධ්‍යයන අංශය<br>ආහාර තාක්ෂණ විද්‍යා අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජීව විද්‍යා අධ්‍යයන අංශය<br>භෞතික විද්‍යා අධ්‍යයන අංශය<br>කාර්මික කළමනාකරණ හා පරිගණක විද්‍යා අධ්‍යයන අංශය<br>ගණිත විද්‍යා අධ්‍යයන අංශය |